**IPRC/16/264**

# උත්තර භාරතීය සංස්කෘතියේ විකාශයට රාම් සහ ක්‍රිෂ්ණ දේව සංකල්පයේ බලපෑම

ආනන්ද අබේසුන්දර[1*]

සාමාජයක පවත්නා ඇදහිලි හා විශ්වාසය සංස්කෘතියක් නිර්මාණය කිරීමට ලබාදෙන දායකත්වය සුළුපටු නොවේ. සංස්කෘතිය, භාෂාව සහ ඇදහිලි අතර ඇත්තේ නොබිඳෙන සම්බන්ධතාවකි. භාරතීය ඇදහිලි හා විශ්වාසයන් හි ක්‍රිෂ්ණ සහ රාම්, විෂ්ණු දෙවියන්ගේ දස අවතාර අතර කැපී පෙනෙන චරිත දෙකක් සේ ම හින්දු ජනයා අතර ඉතා ප්‍රචලිත දෙවිවරුන් දෙදෙනෙකි. අතීතයේ සේ ම වර්තමානයේ ද හින්දු ජනයාගේ පුද පූජාවන්ට පාත්‍රවන ක්‍රිෂ්ණ චරිතය සහ රාම් චරිතය උත්තර භාරතයේ පමණක් සම්පූර්ණ භාරතීය සංස්කෘතියේ උද්භවයට හා විකාශයට පදනම් වූ බව භාරතීය සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනයේ දී දක්නට ලැබෙන කරුණකි.

මෙම සංකල්පයෙන් බැහැරව උත්තර භාරතීය සංස්කෘතියේ උද්භවය හා විකාශය පිළිබඳව සිතීම ද ඉතා අසීරු කාර්යයකි. රාම් . ක්‍රිෂ්ණ කථා පුවත් භාරතීය සංස්කෘතිකාංග වශයෙන් හැඳින්විය හැකි චිත්‍ර, නැටුම්, සංගීත, මූර්ති ආදි කලාවන් කෙරෙහි ද උත්සව, පූජා විධි, ආහාර.පාන විලාසිතා වැනි සංස්කෘතික ප්‍රවර්ග කෙරෙහි ද ඉඳුරා ම බලපෑම් කර ඇති බව පෙනී යයි. උත්තර භාරතීය සංස්කෘතියේ විකාශන කාර්යයට රාම් සහ ක්‍රිෂ්ණ දේව සංකල්පය දායක වී ඇත්තේ කෙසේදැයි විවිධ සංස්කෘතික අංගයන් යටතේ විමසා බැලීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

***ප්‍රමුඛ පද:*** ක්‍රිෂ්ණඃ රාම්ඃ ඇදහිලිඃ සංස්කෘතිය, කලාව, දේව සංකල්පය

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව *anandaabe@kln.ac.lk